09.05.2025

ද මැසිනොද් විදුහල, කඳාන
De Mazenod College, Kandana

De Mazenod College

කතෝලික ධර්මය - I

පළමු වාර පරීක්ෂණය-2025 | 9 ශ්‍රේණිය | කාලය පැය 2

- වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

1) ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොත් කාණ්ඩයකි,
   1. හසුන්පත්
   2. ඉතිහාස පොත්
   3. ශුභාරංචි පොත්
   4. සාමාන්‍ය ලිපි

2) පංච පුස්තකයට අයත් ග්‍රන්ථයක් වන්නේ,
   1. හිතෝපදේශය
   2. විරාවලිය
   3. නික්මයාම
   4. ගීතාවලිය

3) ශුද්ධ බයිබලයේ යාච්ඤා පොත ලෙස හඳුන්වන්නේ,
   1. ගීතාවලිය
   2. ලෙවී ව්‍යවස්ථාව
   3. යෙසායා
   4. හිතෝපදේශය

4) ජේසුස් වහන්සේගෙන් පසුව මුල් කිතුණු සභාවේ වර්ධනය පිළිබඳ සඳහන් ග්‍රන්ථය වන්නේ,
   1. ලූක් සුවිශේෂය
   2. මතෙව් සුභාරංචිය
   3. එළිදරව්ව
   4. ක්‍රියා පොත

5) දුර් පරීක්ෂාවක් පැමිණෙන විට අප කළ යුතු වන්නේ,
   1. යහළුවා සමග බෙදාගත යුතුය
   2. හෘද සාක්ෂියට සවන් දී එයට අවනත විය යුතුය
   3. දෙමාපියන්ට පැවසිය යුතුය
   4. එයට විරුද්ධව සටන් කළ යුතුය

6) ඔබේ වචනය මාගේ දෙපයට පහනක්ය. මාගේ මාවතට එළියක් ය. මෙම දේව වචනය සඳහන් වන්නේ,
   1. හිතෝපදේශයෙහිය
   2. නික්මයාම පොතෙහිය
   3. උත්පත්ති පොතෙහිය
   4. ගීතාවලියෙහිය

7) පීඩන වලට මුහුණ දුන් කිතුණුවන්ගේ විශ්වාසය දිරිමත් කිරීම සඳහා ලියන ලද ග්‍රන්ථයකි.
   1. ධර්ම දේශකයා
   2. එළිදරව්ව
   3. දානියෙල්
   4. හිතෝපදේශය

8) සියොන් යනුවෙන් හැඳින්වෙන්නේ,
   1. ජේරුසලෙමය
   2. ගලීලයය
   3. නාසරතය
   4. නිනිවය ය

9) කායින් හා ආබෙල් නියැලුන රැකී රක්ෂා මොනවාද ?
   1. බැටළු ඒඩේරෙක්/ උයන් ගොවුවෙක්
   2. ගොවියෙක් / කුඹල් කරුවෙක්
   3. බැටළු එඩේරෙක්/ ගොවියෙක්
   4. ගොවියෙක් / කුඹල්කරුවෙක්

10) දෙවියන් වහන්සේ ආදම් හා ඒවට නම් වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ,
   1. මිනිසා නග්නව සිටීම දේව නියමය නොවන බව
   2. ආරම්භයේ සිට මනුෂ්‍යයා වස්ත්‍ර පැළඳ සිටිබව
   3. කන්නලව් කරන පව්කාරයාට පවා උන්වහන්සේ කරුණාව දක්වන බව
   4. මිනිස් දුර් වලතා අභිබය දෙවියන් වහන්සේ අපට කරුණාව දක්වන බව

11) උත්පත්ති 3 . 15) කොටසෙහි දෙවියන් වහන්සේ ස්ත්‍රියගේ වංශය යනුවෙන් හඳුන්වනු ලැබුවේ.
1. ජීවගේ පරම්පරාව
2. ආදම්ගේ පරම්පරාව
3. කායින්ගේ පරම්පරාව
4. මානව වංශය

12) පහත දැක්වෙන ජීව අතරින් සර්ප‍යාට දෙවියන් වහන්සේ ලබාදුන් දඬුවම වන්නේ,
1. පොලොවේ කටු පඳුරු වල් පැලැටි බිහිවීම
2. පොළොවේ සාප ලැබීම
3. ජීවිතය පුරාවටම උරගා යමින් දූවිලි කෑම
4. වනයේ පලා කෑම

13) හොඳ නරක අවබෝ කිරීමේ ගසින් කෑමෙන් මිනිසාට උරුම වූයේ,
1. සදාතන ජීවිතයයි
2. මරණයයි
3. දඬුවමයි
4. ජීදන් උයනයි

14) සහෝදර ප්‍රේමයට පිටුපා යමින් ඊර්ෂ්‍යාව නිසා තම සහෝදරයා මරා දමනු ලැබුවේ.
1. කායින් විසිනි
2. ආබෙල් විසිනි
3. ජාකොබ් විසිනි
4. ජුදා විසිනි

15) මාක් ශුභාරංචියේ සංකේතය වන්නේ,
1. රාජාලියාය
2. මිනිසාය
3. ගවයා ය
4. සිංහයා ය

16) ශුද්ධ බයිබලයේ ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථයකි.
1. සිරාක්
2. විලාප ගී
3. නෙහෙමියා
4. ජොවෙල්

17) ශුද්ධවූ ජොහාන් ශුභාරංචියේ සඳහන් මම වෙමි ප්‍රකාශ හතෙන් අනාවරණය කරන්නේ,
1. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කීකරුකමය
2. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දේව පුත්‍රභාවයය
3. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙ දේවත්වයය
4. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දයා කරුණාවය

18) පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණයේදී ප්‍රධාන කොටස් කීයකට බෙදිය හැකිද ?
1. 3කටය
2. 5කටය
3. 7කටය
4. 2කටය

19) නව ගිවිසුමේ පළමුව ලේඛන ගත වූ සුභාරංචි ග්‍රන්ථය වන්නේ,
1. ශුද්ධවූ මාක් ශුභාරංචිය
2. ශුද්ධවූ මතෙව් ශුභාරංචිය
3. ශුද්ධවූ ලූක් ශුභාරංචිය
4. ශුද්ධවූ ජොහාන් ශුභාරංචිය

20) ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත් උන්වහන්සේ අදහා ගැනීමෙන් සදාතන ජීවිතය ලැබෙන බව ප්‍රකාශ කිරීමේ අරමුණින් ලියවුණු ශුභාරංචි ග්‍රන්ථය වන්නේ,
1. මතෙව් ශුභාරංචිය ය
2. ලූක් ශුභාරංචියය
3. ජොහාන් ශුභාරංචියය
4. මාක් ශුභාරංචියය

09.05.2025

II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

1)

i. ප්‍රඥා සාහිත්‍යයට අයත් පොත් දෙකක් නම් කරන්න.
ii. ගීතාවලිය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
iii. ශුද්ධ බයිබලයේ අඩංගු එළිදරව්වාදී ග්‍රන්ථ දෙක නම් කරන්න.
iv. රාජකීය ගීතිකා ගායනා කරන අවස්ථා දෙකක් ලියන්න.
v. ආදම් සහ ඒවගේ පුතුන් දෙදෙනා නම් කරන්න.
vi. උත්පත්ති 3,15ට අනුව ස්ත්‍රියගේ වංශය හා සර්පයාගේ වංශය ලෙස හඳුන්වනු ලබන පාර් ශව දෙක සඳහන් කරන්න.
vii. පුරාණ ගිවිසුමේ එළිදරව්ව සාහිත්‍ය ග්‍රන්ථය කුමක්ද ?
viii. ගීතාවලියේ ගීත ප්‍රධාන වශයෙන් කාණ්ඩ කීයකට වෙන්කළ හැකිද ?
ix. කරදර හා ආපදා අවස්ථාවලදී සහනය පතා දෙවියන් වහන්සේට ආයාචනා කල ගීත කුමන නමකින් හඳුන්වන්නේද ?
x. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් ප්‍රධාන චරිත දෙන නම් කරන්න.

ල.2x10=20

2)

i. නව ගිවිසුමේ ඇතුලත් ශුද්ධවර ලූක් තුමාගේ කෘති දෙක නම් කරන්න.
ii. සමදර් ශක ශුභාරංචි ග්‍රන්ථ තුන නම් කරන්න.
iii. ධර් මිශ්ඨ ජීවිතයක් ගත කිරිමට දේව වාක්‍ය මහඟු අත්වැලකි මෙම කියමන කරුණු 5ක් ඇසුරින් සනාථ කරන්න.

3)

i. උත්පත්ති පොතට අනුව මිනිසා සහෝදර ප්‍රේමයට විරුද්ධව කටයුතු කළ ආකාරය පෙන්නුම් කරන සිද්ධිය කුමක්ද ?
ii. වරදට වැටුණු කායින්ට දෙවියන් වහන්සේ දුන් දඬුවම් හා ප්‍රතිඵල 3ක් ලියන්න.
iii. කිතුණු දරුවකු ලෙස ඔබ, පාසල තුළ සහෝදර ප්‍රේමයෙන් යුතුව ජීවත් වන්නේ කෙසේද යන්න කරුණු 5ක් දක්වන්න.

4)

i. වර් තමාන සමාජයේ දක්නට ලැබෙන පාපි ක්‍රියා දෙකක් නම් කරන්න.
ii. පාපයට වැටුණු මිනිසාට නියම වූ දඬුවම් තුනක් සඳහන් කරන්න.
iii. පාපය ප්‍රතික්ෂේප කර දේව අභිමතයට ගරු කරමින් නිවැරදි දේ කිරිමට අවශ්‍ය වරම් පතා යැදුමක් ලියන්න (යාච්ඤාවක අඩංගු විය යුතු පියවර අනුගමනය කරන්න)

5)

i. වීර නායකයින්ගේ මූලික කාර් යයන් දෙකක් සඳහන් කරන්න.
ii. ශුද්ධ බයිබලයේ සඳහන් වීර නායකයින් තුන් දෙනෙකු නම් කරන්න.
iii. වීර නායකයිනගේ ජවිත දශර්යට අනුව අන් අයගේ යහපත වෙනුවෙන් ඔබට කළ හැකි කාර් යයන් 5ක් ලියන්න.

6)

i. කායින් හා ආබෙල් දෙවියන් වහන්සේට පූජාකල පඩුරු වෙන වෙනම ලියා දක්වන්න.
ii. අප වරදට වැටෙන විට දෙවියන් වහන්සේ අපට මග පෙන්වන විවිධ පුද්ගලයින් තිදෙනෙකු ලියා දක්වන්න
iii. වරදට වැටුණු ඔබේ මිතුරෙකුට යහමගට ගැනීමට ඔබ විසින් ඔහුට ලබාදෙන අවවාද අනුශාසනා 5ක් ලියන්න.

7)

i. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ පළමු පොත් පහ හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
ii. පැරණි ගිවිසුමට අයත් තුන්වන, හතරවන සහ පස්වන පොත් කාණ්ඩ 3 නම් කරන්න.
iii. ඔබේ පන්ති කාමරයේ සිටින මිතුරා පාසලේ කටයුතු මගහැර වැරදි ක්‍රියාවල යෙදෙන අවස්ථාවක ඔහු/ඇය නිසිමගට ගත හැකි ක්‍රියා මාර් ග පහක් ලියා දක්වන්න.

8) පහත මාතෘකා අතරින් තුනක් තෝරාගෙන වචන පනහකට නොඅඩු කෙටි සටහන් ලියන්න.

i. වීර නායකයෝ
ii. ශුද්ධ බයිබලයේ ග්‍රන්ථ වර් ගීකරණය
iii. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
iv. සමදර් ශක ශුභාරංචිය
v. ඉශ්‍රායෙල් රජවරු